*සැ. යු.*— 2007.05.11 දින අංක 1,497 දරන *ගැසට් පත්‍රයේ* III (අ) කොටස පළ නොකරන ලදී.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,498 - 2007 මැයි 18 වැනි සිකුරාදා - 2007.05.18

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... .. | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... | — | රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — | වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් .. ... ... | 453 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | 452 | විවිධ දැන්වීම් ... ... ... | — |


(i) *සැ. යු.*– රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත 2007 අප්‍රේල් මස 20 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* **II** වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(ii) ජාතික රක්ෂණ භාර අරමුදල (සංශෝධන) පනත් කෙටුම්පත 2007 අප්‍රේල් මස 20 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* **II** වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(iii) කම්කරු නිලධාරීන්ගේ සංගමයේ සුභසාධක අරමුදල (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2007 අප්‍රේල් මස 05 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* **II** වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට් නිවේදන* භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු –ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැලසෙනසේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 2007 මැයි මස 25 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යායුතු දැන්වීම් 2007 මැයි මස 11 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

**ලක්ෂමන් ගුණවර්ධන**,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2007 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

මගේ අංකය : 8/1/4/7/5/රා.තැ.

## ආරච්චිකට්ටුව ප්‍රාදේශීය මහලේකම් කොට්ඨාශය

රා තැබෑරුම් රේන්ද විකිණීම - 2007/2008 වර්ෂය- 2007 ජූලි සිට 2008 ජූනි දක්වා

2007 ජූලි මස 01 දින සිට 2008 ජුනි මස 30 දින දක්වා කාලය තුළ රා සිල්ලරට විකිණීම සඳහා 1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ වී ඇති රා රේන්ද විකිණීමේ කොන්දේසි හා සෑම සුරාබදු බලපත්‍රයක් ම අදාළව එවකට පවත්නා කොන්දේසි මාලාවට යටත්ව පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. සෑම ටෙන්ඩරයක්ම ඕනෑම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයකින් ලබා ගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක සකස් විය යුතු අතර, පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති ටෙන්ඩර් තැන්පත් මුදල් තැන්පත් කළ බවට ලබාගත් කුවිතාන්සියක් හා අදාළ ටෙන්ඩරයේ සඳහන් මිළ ප්‍රමාණය යටත් පිරිසෙයින් 15% ට ලබාගත් වටිනාකම් සහතිකයක් ද, ඇමිණිය යුතුය.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරනු ලැබූ සෑම ටෙන්ඩරයක්ම මුද්‍රා තබන ලද කවරයක බහා එහි මුදුනේ වම් කෙළවරෙහි "අංක ........................................................ රා තැබෑරුම" සඳහා ටෙන්ඩර් පත්‍රය යෙනුවෙන් පහත සඳහන් උපලේඛනයෙහි සඳහන් පරිදි රා තැබෑරුමේ නම සහ අංකය සඳහන් කොට 2007 මැයි මස 30 වැනි දින පෙ. ව. 10.00 ට පෙර ආරච්චිකට්ටුව ප්‍රාදේශීය ලේකම්ට ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. නැතහොත් එම වේලාවට පෙර ආරච්චිකට්ටුව ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය.

04. ටෙන්ඩර් ඉදිරිපත් කිරීම 1982.08.20 දින පළ වී ඇති අංක 207 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* දැක්වෙන රා රේන්ද කොන්දේසිවලට අනුකූල විය යුතුය.

05. 2007 මැයි මස 30 වැනි දින පෙ. ව. 10.00 ට ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අවසන් කළ වහාම ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේ සියලුම ටෙන්ඩර්කරුවන් ආරච්චිකට්ටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතුය. පූර්වෝක්ත දින විකිණීමට නොහැකි වූ තැබෑරුම් නැවත විකිණීම 2007.06.13 වැනි දින පෙ. ව. 10.00ට සිදු කරනු ලැබේ. එදින ටෙන්ඩර් ඉදිරිපත් කිරීම මෙම *ගැසට් නිවේදනයේ* සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතුය.

06. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර ආරච්චිකට්ටුව ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක.

ඩී. සූරසිංහ
ප්‍රාදේශීය ලේකම්,
ආරච්චිකට්ටුව.

2007 අප්‍රේල් 27 වැනි දින.

### උපලේඛනය

| *කොට්ඨාශය* | *ග්‍රාමය* | *තැබෑරුම් අංකය* | *ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය හා වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල රු. ශ.* |
|---|---|---|---|---|
| ආනවිලුන්දන් | කරුකුපනේ | 10 | 2007.05.30 පෙ. ව. 10.00 | 250 00 |
| ආනවිලුන්දන් | ආරච්චිකට්ටුව | 11 | 2007.05.30 පෙ. ව. 10.00 | 250 00 |
| ආනවිලුන්දන් | බත්තුලුඔය | 12 | 2007.05.30 පෙ. ව. 10.00 | 250 00 |

05-273

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

## ඩී.එෆ්.සී.සී. බැංකුව
(කලින් ශ්‍රී ලංකාවේ සංවර්ධන මූල්‍ය සංස්ථාව යනුවෙන් හඳුන්වන ලද)

1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය ආපසු අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විකිණීම

**අංක 1775 සහ 2006.05.31 දිනැති ඇපකරය යටතේ උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තර**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයෙහි, සල්පිටි කෝරළේ, පල්ලෙ පත්තුවෙහි කොළඹ නගර සභා පරිපාලන සීමාව තුළ කොච්චිකඩේ උතුර කොට්ඨාස අංක 9 හි හෙට්ටි වීදිය සහ මුහුදු වෙරළ පාර දිගේ පිහිටියා වූ, දැනට හෙට්ටි වීදියේ අංක 185 සහ 187 ද මුහුදු වෙරළ පාරේ අංක 74 යන තක්සේරු අංකවලින් යුත්, බලයලත් මිනින්දෝරු පී. සින්නතම්බි මහතා විසින් 1999.02.09 දාතමින් යුතු 6849 පිඹුරු පතෙහි ලොට් අංක "ඒ" ලෙස සලකුණු කරන ලද, වෙන් කරන ලද සහ සහතික කරන ලද, ගොඩනැගිලි සහිත බිම් කොටසෙහි සියල්ල. ඉඩමේ ප්‍රමාණය : අක්. 0, රූඩ් 0, පර්. 11.50 පරිශ්‍ර සහ භූමිය, එහි තිබෙන ගොඩනැගිල්ල සහිතව 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මනාව සම්බන්ධිත සමාගමක් වන සහ කොළඹ 11, හෙට්ටිවීදියේ අංක 104 හි එහි ලියාපදිංචි කාර්යාලය පවත්නා සීමාසහිත ධනා මැන්පවර් (පෞද්ගලික) සමාගම විසින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. එම්. ගුණරත්න මහතා සහතික කළ 2006.05.31 දිනැති, අංක 1775 උකස්කරය ප්‍රකාර ඩී. එෆ්. සී. සී. බැංකුවට උකස් කරන ලදුව, ගෙවීම්වල දී පොරොන්දු නිසියාකාර ව ඉෂ්ට නොකරන ලද දේපළ ඩී එෆ්. සී. සී බැංකුව විසින් අප වෙත පවරන ලද බලය යටතේ 2007 ජූනි මස 07 වෙනි දින (බ්‍රහස්පතින්දා) පෙරවරු 11.00 ට පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය.*– මිළ තීන්දු වූ වහා ම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය :

1. ගැනුම් මිලෙන් 10% ක් (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාර),
4. රු. 25,000 ක් වන සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2000.

ගැනුම් මිලෙන් ඉතිරි 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අය බදු හෝ ගාස්තු අය කිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

වැඩි විස්තර සඳහා කරුණාකර ඩී..එෆ්.සී.සී. බැංකුවේ නීති දෙපාර්තමේන්තුව අමතන්න. දුරකථන අංක 011-2442442

ෂොක්මන් සහ සමරවික්‍රම,
9001 : 2000 සහතිකය ලත්, ශ්‍රී ලංකාවේ
ප්‍රසිද්ධ, පුරෝගාමී වරලත් වෙන්දේසිකරුවෝ,
උපදේශක, තක්සේරුකරුවෝ සහ ඉඩම් අලෙවි නියෝජිතයෝ

*ප්‍රධාන කාර්යාලය :*
24, ටොරින්ටන් පාර,
මහනුවර,
දුරකථන : 081-2227593
දුරකථන/ෆැක්ස් : 081-2224371
ඊමේල් : schokmankandy@sltnet.lk

*නගර කාර්යාලය :*
290, හැව්ලොක් පාර,
කොළඹ 05,
දුරකථන : 011-2502680, 2585408
දුරකථන/ෆැක්ස් : 011-2588176
ඊමේල් : schokman@samera1892.com

05-275

---

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් – කොග්ගල ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලොන් ලිමිටඩ් විසින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර, මාතර බලයලත් මානක එස්. එල්. ගලප්පත්ති විසින් 1993 මැයි මස 31 වැනි දින සාදන ලද අංක 4266 ඒ දරන පිඹුර පරිදි දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, තල්පෙපත්තු කතළුව පිහිටි දත්ගහඹිවිට *හෙවත්* මිරිහාන දත්ගහඹිවිට ලොට් 1 සහ 2 දරන ඒකාබද්ධ ඉඩමේ සියලුදේත් සමග බෙදා වෙන් කරන ලද ලොට් 'ඒ' දරන රූඩ් එකයි, පර්චස් දහයක් (අ. 0, රූ. 1, පර්. 10) හෝ (හෙක්ටයාර් 0.1265) විශාල ඉඩම සහ එහි තුළ පිහිටි සියළුදේත් සමග වේ.

ගල්බොක්ක හේවගේ බර්ට් ණයකරු සහ උකස්කරු හැටියටද සහ වන්නිආරච්චිගේ රම්‍යා ප්‍රියන්ති ෆේොන්සේකා *හෙවත්* වන්නි ආරච්චිගේ රම්‍යා ප්‍රියන්ති ෆේොන්සේකා ණයකරු හැටියට ද, කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්ට උකස් කරන ලද ඉහත සඳහන් කළ දේපළ, වර්ෂ 2007 ක් වූ ජූනි මස 12 වැනි දින ප.ව. 1.00 ට එම දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2004.12.17 දින *රජයේ ගැසට් පත්‍රයේ* ද, 2006.02.24 දින ලංකාදීප, ද අයිලන්ඩ් සහ තිනකරන් පුවත්පත් ද බලන්න. විකිණීම පිළිබඳ දැන්වීම සඳහා 2007.05.18 දින *රජයේ ගැසට් පත්‍රයේ* ද, ලංකාදීප සහ අයිලන්ඩ් පත්‍රද බලන්න.

*ඉඩමට පිවිසීම.*– අහංගම කතළුව - තිත්තගල්ල පාරේ සිට මෙම දේපළට කෙලින්ම ප්‍රවේශ විය හැක. මීටර් 50 ක් පමණ දුම්රිය හරස් පාර පසු කොට ගියවිට දකුණු පසින් මෙම දේපළ පිහිටා ඇත. ගාල්ල - මාතර මහා මාර්ග ඔස්සේ මීටර් 150 ක් පමණ වේ.

*ගෙවීමේ ක්‍රමය.* - විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීමේ වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුයි.

01. ගැණුම් මිලෙන් සියයට දහයක් (10%),
02. පළාත් සභා අයබදු සඳහා සියයට එකක් (01%),
03. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් ගැණුම් මිලෙන් සියයට දෙකයි දශම පහක් (2.5%),
04. නොතාරිස් ගාස්තුව රු. 2000,
05. ලිපිකරු සහ සෝෂක වේතනය රු. 500,
06. වෙන්දේසිය සඳහා වැය කරන ලද සියලුම ප්‍රචාරක වියදම්,
07. ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනුව (90%) විකිණීමේ දින සිට දින 30 ක් ඇතුලත කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමටඩ් හි ප්‍රධාන ශාඛාවේ හෝ කොග්ගල ශාඛාවේ තැන්පත් කළ යුතුයි.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න.

එල්. බී. සේනානායක - සාම විනිසුරු,
බලයලත් ජ්‍යෂ්ඨ වෙන්දේසිකරු, තක්සේරුකරු,
සහ උසාවි කොමසාරිස්, කොළඹ වාණිජ
මහාධිකරණය සහ දිසා අධිකරණය, බලයලත් ජ්‍යෂ්ඨ
වෙන්දේසිකරු, රාජ්‍ය බැංකු සහ වාණිජ බැංකු
අංක 99, උසාවිය පාර, කොළඹ 12.
දුරකථන/ෆැක්ස් අංකය : 2445393

කළමණාකරු,
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්,
එච්/08, අපනයන ප්‍රවර්ධන කලාපය,
ගාලු පාර, කොග්ගල.

දුරකථන අංක : 091-2283485
091-2282339
091-2283388
ෆැක්ස් අංකය : 091- 2282444

05-281

## මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා ලිමිටඩ්

### හොරණ කහටපිටියෙන් අ. 01, රූඩ් 01 ක් විශාල අගනා ඉඩමක්

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, රයිගම් කෝරලයේ, කුඹුකේ පත්තුවේ, කහටපිටියේ පිහිටි "හැදිවිලාදෙණිය " නමින් හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මානක එන්. ද එස්. වීරක්කොඩි විසින් 1992 අප්‍රේල් මස 04 වන දින සාදන ලද අංක. 3027 දරන පිඹුර ප්‍රකාර නැගෙනහිරට: ජේ. දොන් අන්දිරිස් සහ තවත් අය විසින් හිමිකම් පාන ලදැයි කියනු ලබන ඉඩමද, නිරිත දිගට : රජයේ ඉඩමෙද ගිණිකොනින් : පාරද, වයඹ දිගින් : හොරණ සිට පාදුක්ක දක්වා දිවෙන ප්‍රධාන පාරකින්ද යන සතර මායිමෙන් වටවූ අක්කර එකයි රූඩ් එකක (අ. 01, රූඩ්.01, පර්. 0) වපසරිය ඇති පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාල සී 61/223 හි ලියාපදිංචි කර ඇත.

රුපියල් විසි ලක්ෂ තිස් දහස් එකසිය හැත්තෑ තුනයි ශත අසූහත (රු. 2,030,173.87) ක මුදලක් සහ එම මුදල මත 1995 ජනවාරි මස 13 වන දින වසරකට විසිපහක (25%) බැගින් පොලියද, නඩු ගාස්තු සහ වෙන්දේසිකරුග් ගාස්තු ද අයකර ගැනීම සඳහා හොරණ, කහටපිටියේ පදිංචි කුකුළගේ ජනක පුෂ්පකුමාර යන අයට විරුද්ධව කොළඹ 03, ශාන්ත මයිකල් පාරේ අංක. 26 දරන ස්ථානයේ පිහිටා ඇති මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා ලිමිටඩ් යන ආයතනය විසින් පවරා ඇති කොළඹ දිසා අධිකරණයේ නඩු අංක. 16670 එම් බී දරන නඩුවෙන් මා වෙත පවරන ලද කොමිසම් මත ඉහත සඳහන් දේපළ වර්ෂ 2007 ක් වූ ජූනි මස 25 වන දින පෙරවරු 11.00 ට අදාල දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය.*–වෙන්දේසිය අවසන් වූ විගස ගැණුම්කරු විසින් පහත සඳහන් මුදල් එවේලේම වෙන්දේසිකරු වෙත ගෙවා සිටිය යුතුය (1) ගැණුම් මිලෙන් 25% ක් ද, (2) පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1% ක්ද, (3) වෙන්දේසිකරුගේ ගාස්තු වශයෙන් 2 1/2% ක් ද, (4) වෙන්දේසි සඳහා දරන්නට වූ වියදම් ද, (5) වෙන්දේසි කොන්දේසි සහතික කිරීමේ ගාස්තු වශයෙන් රු. 2,000, (6) ලිපිකරු හා සෝෂක ගාස්තු වශයෙන් රු. 1,000 ක මුදලක්ද වන අතර ගැණුම් මිලේ පරිශේෂය වෙන්දේසි දිනයේ සිට දින 30 ක් ඇතුළත කොළඹ දිසා අධිකරණයේ අංක 16,670 එම්බී දරන මෙම නඩුවේ බැරට තැන්පත් කළ යුතුය.

වැඩිදුර විස්තර සහ අදාල ලියවිලි පරීක්ෂා කිරීම සඳහා කොළඹ 03, ශාන්ත මයිකල් පාරේ, අංක. 28 දරන ස්ථානයේ පිහිටි මර්චන්ට් ගොඩනැගිල්ලේ 14 මහලේ කළමණාකාරිණී නීති නීතිඥ මිහුරුම් ජයසිංහ මහත්මියගෙන් විමසන්න. දුරකථන අංක. 4711711 හෝ 47411781.

පී. කේ. ඊ. සේනාපති,
උසාවි කොමසාරිස්, තක්සේරුකරු සහ
වරලත් වෙන්දේසිකරු.

134, බැද්දගාන පාර, කෝට්ටේ,
දුරකථන අංක: 2873656, ෆැක්ස් : 2871184 ජංගම: 0777-672082.

05-286

## සීමාසහිත සම්පත් බැංකුව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය

ජී. එච්. සෝමසිරි
ගිණුම් අංකය : 0010 5002 3350

1990 අංක 4 දරන, බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ 2004.06.23 වන දින සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂක මණ්ඩලය විසින් සම්මත කරගන්නා

ලදුව, 2004.07.16 දින *ගැසට් පත්‍රයේ* සහ 2004.07.02 වන දින 'දිනමිණ', 'ඩේලිනිවුස්', සහ 'තිනකරන්' යන දිනපතා පුවත්පත්වල පළ කරන ලද යෝජනා සම්මතය ප්‍රකාර රුපියල් හැටපන් ලක්ෂ හැත්තෑ එක් දහස් තුන්සිය අනූතුනකුත් ශත විසිහතක් (රු.6,571,393.27) පමණක් වූ මුදල සහ 2004 මාර්තු 24 වන දින සිට විකිණීමේ දිනය දක්වා රුපියල් තිස්දෙලක්ෂ හතලිස් හතර දහසක් (රු.3,244,000) සඳහා වර්ෂයකට සියයට දොළහකුත් දශම නවයක් (12.9%) බැගින් සහ රුපියල් පහළොස් ලක්ෂයක් (රු.1,500,000) සඳහා සියයට දහහතර (14%) බැගින් වූ පොලියද, ප්‍රචාරක වියදම් සහ දරා ඇති වෙනත් ගාස්තු ද, ඉන්පසුව යම් මුදලක් ගෙවා ඇත්නම් ඒ මුදල අඩුකොට අයකර ගැනීම සඳහා, මෙහි උපලේඛනයේ විස්තර කර ඇති දේපළ 2007.06.07 දින පෙ. ව. 10.30 ට, ප. ව. 3.00, ප. ව. 3.30ට කොළඹ, බලයලත් වෙන්දේසිකාර ඩන්ස්ටන් කෙලාර්ට් මහතා විසින්, ඒ දේපළ පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

## උපලේඛනය

පළමුව :

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මොරවක කෝරළේ, නැගෙනහිර රොටුඹ ග්‍රාමයේ පිහිටි 'මුත්තේට්ටුමුලහේන' නැමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු ඩී. පී. විමලසේන විසින් මැන සාදන ලද 1997 පෙබරවාරි 07 දාතම හා අංක 2220 ඒ දරන පිඹුරේ (පැරණි පිඹුර එෆ්වීපී 44) ලොට් 869 වශයෙන් ලකුණු කොට දක්වා ඇති උතුරට : එම ඉඩමේම ලොට් 888 ද, නැගෙනහිරට : එම ඉඩමේම ලොට් 868 ද, දකුණට : එම ඉඩමේම ලොට් 885 සහ බස්නාහිරට : එම ඉඩමේම ලොට් 870 ද මායිම් වන, ප්‍රමාණයෙන් අක්කර දෙකයි, පර්චස් දහයක් (අක්. 2, පර්. 10) වන, මොරවක ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව ජී 80/28 හි ලියාපදංචි කොට ඇති එකී ලොට් 869 දරන බෙදා වෙන් කොට සීමා නිර්නය කළ ඉඩම එහි පිහිටි පස, ගසකොළ, ගොඩනැගිලි සහ සෑම සියලු දේ සමගය.

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මොරවක කෝරළේ, නැගෙනහිර රොටුඹ ග්‍රාමයේ, පිහිටි 'මුත්තේට්ටුමුලහේන', නැමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු ඩී. පී. විමලසේන විසින් මැන සාදන ලද 1997 පෙබරවාරි 08 දාතම හා අංක 2220 බී දරන පිඹුරේ (පැරණි පිඹුර එෆ්වීපී 44) ලොට් 843 වශයෙන් ලකුණු කොට දක්වා ඇති උතුරට : එම ඉඩමේම ලොට් 845 ද, නැගෙනහිරට : එම ඉඩමේම ලොට් 842 ද, දකුණට : එම ඉඩමේම ලොට් 853 සහ ලොට් 852 ද සහ බටහිරට : එම ඉඩමේම ලොට් 844 ද මායිම් වන ප්‍රමාණයෙන් පර්චස් තිස්නවයක් (අක්. 0, රූ. 0, පර්. 39) වන මොරවක ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව ජී 80/28 හි ලියාපදිංචි කොට ඇති එකී ලොට් 843 දරන බෙදා වෙන්කොට සීමා නිර්නය කළ ඉඩම එහි පිහිටි පස, ගසකොළ, ගොඩනැගිලි සහ සෑම සියලු දේ සමගය.

දෙවනුව :

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මාතර කඩවත් සතර ඇතුළත හිත්තැටියේ පිහිටි හුනුඇලවිල ලොට් ඒ නැමැති ඉඩමේ ලොට් 1 වශයෙන් ලකුණු කොට දක්වා ඇති උතුරට : එම ඉඩමේම කොටසක් ද, නැගෙනහිරට : පාරද, දකුණට : එම ඉඩමේම ලොට් 2 ද සහ බස්නාහිරට : එම ඉඩමේම කොටසක්ද මායිම් වන ප්‍රමාණයෙන් පර්චස් විසිදෙකයි දශම පහක් වන, (අ. 0, රූ. 0, පර්. 22.5) බලයලත් මිනින්දෝරු සී. එස්. ජයවර්ධන විසින් මැන සාදන ලද 1997 මාර්තු 18 දාතම හා අංක 5627 දරන පිඹුරේ දැක්වෙන, මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව ඒ 406/247 හි ලියාපදිංචි කොට ඇති බෙදා වෙන්කොට සීමා නිර්නය කළ ඉඩම් කොටස එහි පිහිටි ගසකොළ, වගාවන්, ගොඩනැගිලි සහ සෑම සියලු දේ සමග.

එකී අංක 5627 දරන පිඹුරේ නැගෙනහිර මායිමට ඇති මාර්ගය මතින් හා ඔස්සේ මාර්ග අයිතිය ද සමග ය.

B2 – B 079489

ඉහත කී හිත්තැටියේ පිහිටි හුනුඇලවිල ලොට් ඒ නැමැති ඉඩමේ ලොට් 2 වශයෙන් ලකුණු කොට දක්වා ඇති බලයලත් මිනින්දෝරු සී. එස්. ජයවර්ධන විසින් මැන සාදන ලද 1997 මාර්තු 18 දාතම හා අංක 5627 දරන පිඹුරේ නිරූපිත උතුරට : එම ඉඩමේම ලොට් 1 ද, නැගෙනහිරට : මාර්ගයද, දකුණට : එම ඉඩමේම ලොට් 3, 4, 5 ද සහ බටහිරට : එම ඉඩමේම කොටසක්ද මායිම් වන ප්‍රමාණයෙන් පර්චස් විසිතුනයි දශම පහක් (අ. 0, රූ. 0, පර්. 23.5) වන මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව ඒ. 406/248 හි ලියාපදිංචි කොට ඇති බෙදා වෙන්කොට සීමා නිර්නය කළ ඉඩම් කොටස එහි පිහිටි ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ සෑම සියලු දේ සමගය.

තෙවනුව :

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මාතර කඩවත් සතර ඇතුළත දෙල්කද පාරේ පිහිටි (වරිපනම් අංක 2482 දරන) දැනට අලව්ට ගාඩින්ස් යනුවෙන් හැඳින්වෙන, කෙන්දවෙල, ඊරියගහවල, පිට්ටනිය *නොහොත්* වත්ත, කැබෙල්ලගහවත්ත, අමාගෙවත්ත සහ ඕවිට යනුවෙන් හැඳින්වෙන ඒකාබද්ධ ඉඩම් වලින් සීමා නිර්නය කළ ලොට් ඒ හි ලොට් 13 සහ උතුරට : ලොට් (අඩි පහළොවක පාර) ද, නැගෙනහිරට : එම ඉඩමේම ලොට් 12 ද, දකුණට : ගාල්ල වලව්වෙ පැපිලිය පිට්ටනියද සහ බටහිරට : මහබැද්දෙ කොරටුව ද මායිම් වන, බලයලත් මිනින්දෝරු එෆ්. විජේවීර විසින් මැන සාදන ලද 1969 මාර්තු 22 දාතම හා අංක 1115 දරන පිඹුරේ නිරූපිත, ප්‍රමාණයෙන් පර්චස් විස්සක් (අක්. 0, රූ. 0, පර්. 20) වන, මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 421/214 වෙළුමේ/පත්‍රිරුවේ ලියාපදිංචි කර ඇති සීමා නිර්නය කළ ලොට් ඒ හි ලොට් 13 ඉඩම් කොටස එහි පිහිටි සියලුම ගොඩනැගිලි හා සමග ය.

ඉහත කී ලොට් 13 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම ප්‍රතිමිණුම් කොට, බලයලත් මිනින්දෝරු එම්. එල්. එම්. රිස්මි විසින් සාදන ලද 2000 අප්‍රේල් 18 දාතම හා අංක 1053 පිඹුරේ ලොට් 13 වශයෙන් දැන් නිරූපිතය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්.

05-287

---

## මහජන බැංකුව - මරදාන ශාඛාව

### 1986 අංක 32 පනතින් සංශෝධිත 1961 අංක 29 දරණ මහජන බැංකු පනතේ 29ඩී වන වගන්තිය

### මාලබේ, තලාහේන කොළඹ සංවර්ධන සභා සීමාව තුල පිහිටි වටිනා පදිංචියට සුදුසු දේපල විශාලත්වය පර්චස් 15

මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ 2007.06.16 දින පෙරවරු 11.00 ට දේපල පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*රජයේ ගැසට් පත්‍රයේ* 2003.04.04 දින ද, ඩේලි නිවුස්, දිනමිණ හා තිනකරන් පුවත්පත්වල 2003.03.25 දින ද පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපලට පිවිසීම.*– තලාහේන හන්දියෙන් හිඹුටාන පාරේ ගොස් තලාහේන මහා විද්‍යාලය අසලින් ඇති පරාක්‍රම මාවතේ මීටර 300 පමණ ගිය තැන පරාක්‍රම මාවත 2 පටුමගේ යාර 100 ක් පමණ ගියවිට පාරේ දකුණ පස දේපල පිහිටා ඇත.

*ගෙවීම් ක්‍රමය*.- වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැනුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම කළ යුතුය :

01. ගැනුම් මිළෙන් 10%,
02. පළාත් අධිකාරි බදු සඳහා පළාත් අධිකාරියට 01%,
03. වෙන්දේසියේ කොමිස් වශයෙන් 2 1/2%,
04. ලිපිකරු හා නිවේදකයාගේ ගාස්තු වශයෙන් රු.500 ක්,
05. විකුණුම් වියදම් හා වෙනත් ගාස්තු වෙතොත් මුදල රු. 500,
06. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැනුම් මිලෙන් 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුලත සහකාර සාමාන්‍යාධිකාරී (බටහිර කලාප 01), මහජන බැංකුව, කලාපීය ප්‍රධාන කාර්යාලය (බටහිර කලාප 01), අංක 11, ආදිපාද වීදිය, කොළඹ 01 වෙත ගෙවිය යුතුය.

දුරකථන අංකය.– 011-2387068, 011-2393678, ෆැක්ස් අංකය - 011-2435977 හිමිකම් ඔප්පු සහ වෙනත් අදාල විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැක.

ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කල මුදල් දින 30 ක් ඇතුලත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැනුම් මුදලින් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපල විකිණීමට බැංකුවට අයිතිය ඇත.

සී. කුමාරසිංහ,
බලයලත් වෙන්දේසිකරු, තක්සේරුකරු සහ
උසාවි කොමසාරිස්.

අංක 60/50, දෙල්ගහවත්ත,
පමුණුව පාර,
මහරගම,
දුරකථන අංකය : 011-2746383

05-285